# තේ තතු

දෙවන කලාපය

ISSN - 1391-6785

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශණයකි

පළවෙනි කාණ්ඩය, දෙවෙනි කලාපය 2001 ජූලි - දෙසැම්බර්


## කොළ පොහොර ප්‍රභේදයක් ලෙස - සෙස්බේනියා සෙස්බන්

වැල් - මුරුංගා ලෙස සිංහලයෙන්ද සෙස්බේනියා සෙස්බන් (*Sesbania sesban*) යන උද්භිද නාමයෙන්ද හඳුන්වන පැලෑටිය නිවර්තන කලාපයේ කොළ පොහොර ලබා ගැනීමට භාවිතා කරන බෝගයකි. එය දේශීය වෛද්‍ය ක්‍රමයේදී ඖෂධයක් ලෙස ද යොදා ගැනේ. මෙම ශාකයේ ළඟම ඥාතියෙකු වන්නේ, මල් හා කොල අනුභවයට ගනු ලබන, කතුරුමුරුංගා ශාඛයයි. සෙස්බේනියා සෙස්බන් යනු මීටර් 2-3 ක් පමණ උසට, අතුපතර හොඳින් විහිදී වැඩෙන මධ්‍යම තරමේ ශාකයකි. කතුරු මුරුංගා තරම් උස නොයන වැල් මුරුංගා ශාකය හඳුනා ගැනීමට පහසු ලක්ෂණයක් නම් එහි අඳුරු කහ පැහැති පුෂ්ප හට ගැනීමයි. මෙම පුෂ්ප වල දළ පත්‍රයේ (එනම් විශාලම පෙත්තේ) පිටු පස දම් පැහැති තිත් වැටී ඇත. මෙම ශාකයෙන්, තේ ඉඩම් වලට ප්‍රයෝජන රැසක් ගත හැකිය. එය කොළ පොහොර ලබා ගැනීමට මෙන්ම නොමේරූ තේ පැල සුළඟින් හා තද හිරු එළියෙන් ආරක්ෂා කර ගැනීමටද ආධාර වේ.

වටපණු හානියට (නෙමටෝඩා හානියට) ලක්වීමට ඇති අවදානම නිසා ඉහල උච්චත්වයක් ඇති ඉඩම් වල සෙස්බේනියා විශේෂ වගා කිරීමට අතීතයේ උනන්දු නොවිණි. නමුත් මෙම තත්වය අදාල වන්නේ වෙනත් සෙස්බේනියා විශේෂ සඳහා බවත්, සෙස්බෙනියා සෙස්බන් විශේෂයට එවැනි අවදානමක් නොමැති බවත් තේ පර්යේෂණායතනය විසින් මෑතකදී සිදු කරන ලද පර්යේෂණ වලින් අනාවරණය වී තිබේ. එමනිසා සෙස්බෙනියා සෙස්බන් නැමති විශේෂය නෙමටෝඩාවන් බහුල උඩරට හා ඌව වැනි ප්‍රදේශ වල තේ ඉඩම් තුළද වගා කළ හැකි බව නිගමනය කර තිබේ.

- සුශීලා අයි. විතාරණ